සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 12 ශ්‍රේණිය, මධ්‍ය වාර පරීක්ෂණය, 2020 මාර්තු

**General Certificate of Education (Adv. Level), Grade 12, Mid Term Test, March 2020**

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I
## Communication and Media Studies - I

29 S I

පැය දෙකයි
Two hours

විභාග අංකය : ......................................................................

***සැලකිය යුතුයි.***

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.**
- **අංක 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්ණයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරැදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරාගෙන එය සපයා දෙන කොටු පත්‍රයේ කතිරයක් (X) යොදා දක්වන්න.**

(01) පැරණි මුද්‍රණ ශිල්පයේ සහ නූතන මුද්‍රණ ශිල්පයේ ආරම්භක රටවල් ලෙස සැලකෙන්නේ පිළිවෙළින්,

(1) ඊජිප්තුව සහ ප්‍රංශය යි.
(2) ස්පාඤ්ඤය සහ ප්‍රංශය යි.
(3) චීනය සහ ජර්මනිය යි.
(4) ඉන්දියාව සහ ඇමරිකාව යි.
(5) ග්‍රීසිය සහ රෝමය යි.

(02) මිනිසුන් අතර අදහස් හා හැඟීම් සන්නිවේදනය කළ හැක්කේ ඒවා,

(1) සංකේත මඟින් නියෝජනය වන්නේ නම් පමණි.
(2) මුද්‍රා මඟින් නියෝජනය වන්නේ නම් පමණි.
(3) වචන මඟින් නියෝජනය වන්නේ නම් පමණි.
(4) නිරන්තරව භාවිත වන්නේ නම් පමණි.
(5) සංස්කෘතික ලක්ෂණ මඟින් නියෝජනය වන්නේ නම් පමණි.

(3) සන්නිවේදන විෂය "සන්නිවේදන අධ්‍යයනය" නමින් ස්වාධීන විෂය ක්ෂේත්‍රයක් ලෙස හැඳින්වීමට පෙර ප්‍රධාන විෂය තුනක් යටතේ ශික්ෂණය විය.

(1) සමාජවිද්‍යාව, දේශපාලන විද්‍යාව, දර්ශනය
(2) මනෝවිද්‍යාව, සමාජ විද්‍යාව, දේශපාලන විද්‍යා
(3) දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යාව, ආචාර විද්‍යාව
(4) සමාජ විද්‍යාව, ආචාර විද්‍යාව, මනෝවිද්‍යාව
(5) මනෝවිද්‍යාව, ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව

(04) අධ්‍යාපන විද්‍යා ක්ෂේත්‍රයේ පර්යේෂණ සිදු කළ ආචාර්යවරයා වන්නේ,

(1) චාල්ස් කූලිය.
(2) වෝල්ටර් ලිප්මාන්ය.
(3) කර්ට් ලෙවින්ය.
(4) හැරල්ඩ් ලැස්වෙල්ය.
(5) ජෝන් ඩූවී ය.

(05) ජර්මනියේ ඒකාධිපති. පාලක ඇඩොල්ෆ් හිට්ලර්ගේ මාධ්‍ය ඇමතිවරයා වූයේ,

(1) කාර්ල් හවුලන්ඩ් ය.
(2) ක්ලෝඩ් ෂැනන් ය.
(3) ජෝෂප් ගොබෙල්ස් ය.
(4) බොනිටෝ මුසෝලිනී ය.
(5) මුවමර් ගඩාෆි ය.

(06) සන්නිවේදනය ශාස්ත්‍රීය ලෙස අධ්‍යයනය කිරීමෙන් ලබෙන ප්‍රයෝජන අතර අවම වැදගත්කමක් ඇත්තේ,

(1) විචාරශීලීව මාධ්‍ය පරිහරණය කිරීමේ කුසලතා වර්ධනය
(2) මාධ්‍ය සාක්ෂරතාව වර්ධනය
(3) සමාජ ප්‍රගමණය සඳහා සක්‍රීය දායකත්වය
(4) අවශ්‍ය අදාළ තොරතුරු තෝරාගැනීමේ කුසලතාව
(5) ජනප්‍රිය සංස්කෘතියේ සාමාජිකයකු වීම.

(07) සන්නිවේදනය ශාස්ත්‍රීය ලෙස අධ්‍යයනය කිරීමට දායක **නොවූ** විද්වතකු වූයේ,

(1) කර්ට් ලෙවින් ය.
(2) අයිවර් ජෙනිංග්ස් ය.
(3) හැරල්ඩ් ලැස්වෙල් ය.
(4) විල්බර් ශ්‍රාම් ය.
(5) ජෝර්ජ් ගාබ්නර් ය.

(08) මාධ්‍යයක ප්‍රධාන ම අරමුණ වන්නේ,

(1) පාලක පන්තියේ දෘෂ්ටිවාදය පෝෂණය කිරීම යි.
(2) සංවර්ධන තොරතුරු ඉදිරිපත් කිරීම යි.
(3) දැන්වීම් මඟින් පුද්ගලයා පෙළඹවීම යි.
(4) සමාජ අවශ්‍යතා විෂය මූලික තොරතුරු මඟින් සංතෘප්ත කිරීම යි.
(5) සියලු සිදුවීම් ග්‍රාහකයන් වෙත ඉදිරිපත් කිරීම යි.

(09) සන්නිවේදන මූලිකාංගවලට අයත් විකේතීකරය යනු,

(1) තොරතුරු ප්‍රතිග්‍රහණය කරන්නා ය.
(2) අර්ථකථනය කරන්නා ය.
(3) සංඥා සංකේත බවට පත් කරන්නා ය.
(4) සම්ප්‍රේෂණය කරන්නා ය.
(5) ප්‍රතික්ෂේප කරන්නා ය.

(10) සන්නිවේදනයේ ස්වභාවය හඳුන්වා දීමේ දී වඩාත් ගැළපෙන පිළිතුර වන්නේ,

(1) සන්නිවේදනය ද්විමාර්ගික වීම යි.
(2) සන්නිවේදනය වාරණය මත සිදු වීම යි.
(3) සන්නිවේදනය බාධක සහිත වීම යි.
(4) සන්නිවේදනය ක්‍රියාවලියක් වීම යි.
(5) සන්නිවේදනය ප්‍රතිචාර මත පැවතීම යි.

(11) ආකේතකරණ ක්‍රියාවලියේ දී සන්නිවේදකයා වඩාත් අවධානය යොමු කළ යුත්තේ,

(1) ආකර්ශනීය සංකේත භාවිත කිරීම යි.
(2) නිර්මාණාත්මක සංකේත භාවිත කිරීම යි.
(3) සම්මත සංකේත භාවිත කිරීම යි.
(4) දෘශ්‍ය සංකේත භාවිත කිරීම යි.
(5) සන්නිවේදන කේන්ද්‍රීය සංකේත භාවිත කිරීම යි.

(12) මිනිසා තොරතුරු සහ සන්නිවේදන මාධ්‍ය සමඟ ගත කරන කාලය ක්‍රමිකව ඉහළ යමින් පවතින බව පර්යේෂණ වාර්තා මඟින් තහවුරු වී තිබේ. එවැනි පසුබිමක් නිර්මාණය වී ඇත්තේ,

(1) ජංගම දුරකථනවල ශීඝ්‍ර ව්‍යාප්තිය යි.

(2) නව සන්නිවේදන තාක්ෂණ උපකරණ සරල වීම හේතුවෙනි.

(3) අන්තර්ජාල සබඳතා සුලබ වීම යි.

(4) තොරතුරු ජාලගත වීමයි.

(5) ලොවපුරා රූපවාහිනී මාධ්‍ය ව්‍යාප්ත වීම යි.

(13) නූතන ජනමාධ්‍යවල තාක්ෂණික පදනමේ ප්‍රාරම්භකයා වන්නේ,

(1) ගුග්ලි එල්මෝ මාර්කෝනිය. (2) ඇලෙක්සැන්ඩර් ග්‍රැහම් බෙල් ය.

(3) සායි ලුන් ය. (4) ජොහැන්නස් ගුටෙන්බර්ග් ය.

(5) තෝමස් අල්වා එඩිසන් ය.

(14) සන්නිවේදනය රේඛීය ලෙස ක්‍රියාත්මක වීමට අත්‍යවශ්‍ය අංග වන්නේ,

(1) සන්නිවේදකයා, ග්‍රාහකයා බලපෑම හා ප්‍රතිචාර යි.

(2) සන්නිවේදකයා පණිවිඩය ප්‍රතිපෝෂණය හා බාධාව යි.

(3) සන්නිවේදකයා, සන්දේශය, මාධ්‍ය හා ග්‍රාහකයා යි.

(4) මූලාශ්‍රය, ආකේතකරණය, සන්දේශය හා මාධ්‍යය යි.

(5) සන්නිවේදකයා, මාධ්‍ය, බලපෑම හා ග්‍රාහකයා යි.

(15) ජනමාධ්‍ය

A - තොරතුරු සන්නිවේදනයට ප්‍රමුඛතාව ලබාදිය යුතු ය.

B - විනෝදය සඳහා යම් ඉඩක් වෙන් කළ යුතු ය.

C - බොහෝ විට දැන්වීම්කරණය මත පදනම් විය යුතු ය.

D - රටක සංවර්ධන ක්‍රියාවලියට දායක විය යුතු ය.

E - සමාජය පිළිබඳ සුපරීක්ෂාකාරී විය යුතු ය.

ඉහත ප්‍රකාශ අතරින් **සත්‍ය** වන්නේ,

(1) A, B හා C පමණි (2) A, B හා D පමණි

(3) A, C හා E පමණි (4) A, B, D හා E පමණි

(5) A, B, C, D හා E යන සියල්ල ය.

(16) ශ්‍රී ලංකාවේ මුද්‍රිත ප්‍රථම සිංහල ප්‍රකාශනය විය හැක්කේ,

(1) මාසික තෑග්ග යි. (2) සරසවි සඳරැස යි.

(3) ලංකා ලෝකය යි. (4) ලක්මිණි පහන යි.

(5) ස්වදේශ මිත්‍රයා යි.

(17) මහාචාර්ය විමල් දිසානායක කථිකාචාර්යවරයකු ලෙස සේවය කරන ලද්දේ,

(1) දෙහිවල කනිෂ්ඨ විශ්වවිද්‍යාලයේ ය. (2) කැලණිය විශ්වවිද්‍යාලයේ ය.

(3) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ය. (4) අයෝවා විශ්වවිද්‍යාලයේ ය.

(5) ශ්‍රීපාලි මණ්ඩපයේ ය.

(18) ජනමාධ්‍යයන්ගේ ක්‍රියාකාරිත්වය ළමා හා තරුණ පරපුර කෙරෙහි ඇති කරන ලද අහිතකර බලපෑම හේතුවෙන් මාධ්‍ය අධ්‍යයනය පාසල් විෂය ධාරාවට ඇතුළත් කළ යුතු බව නිර්දේශ කරන ලද්දේ,

(1) ජාතික අධ්‍යාපන ආයතනය යි. (2) පෙන්සිල්වේනියා විශ්වවිද්‍යාලය යි.

(3) ඉලිනොයි විශ්වවිද්‍යාලය යි. (4) ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලය යි.

(5) යුනෙස්කෝ සංවිධානය යි.

(19) සන්නිවේදනයේ ස්වභාවයක් අතරට අයත් නොවන්නේ,

(1) අරමුණු සහගත වීම. (2) සංකේතාත්මක වීම.
(3) වාරණයක් සහිත වීම. (4) සන්දර්භයානුගත වීම.
(5) විවිධාකාර වීම.

(20) සන්නිවේදනය යනු යම් තැනක දී නිර්මාණය කරගත් හෝ තෝරාගත් පණිවිඩයක් ඒ ආකාරයෙන් ම හෝ ඊට සමාන ලෙස වෙනත් තැනක දී ප්‍රතිනිර්මාණය කිරීම යි.” මෙම නිර්වචනය ඉදිරිපත් කළේ,

(1) ෂැනොන් සහ වීවර් ය. (2) විල්බර් ශ්‍රාම් ය.
(3) චාල්ස් කුලි ය. (4) හැරල්ඩ් ලැස්වෙල් ය.
(5) ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය

(21) සන්නිවේදනය මගින් ඉටුකරන මූලික කාර්යයන් හතරට අයත් නොවන්නේ,

(1) තොරතුරු සම්පාදනය (2) උපදෙස් සම්පාදනය
(3) පෙළඹවීම (4) විනෝදාස්වාදය
(5) සුපරීක්ෂණය

❍ **අංක 22 සිට 28 තෙක් ප්‍රශ්නවලට පහත දැක්වෙන විවිධ සන්නිවේදන අංග ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

| | | |
|---|---|---|
| A - සන්නිවේදකයා/ ආකේතකරය | B - පණිවිඩය | C - බලපෑම |
| D - සංඥා | E - ග්‍රාහකයා/ විකේතකරය | F - ප්‍රතිපෝෂණය |
| G - බාධක | H - මාධ්‍ය | I - සම්ප්‍රේෂකය |
| J - අර්ථකථනය | K - නියාමකයෝ | L - දොරටුපාලක |
| M - අත්දැකීම් ක්ෂේත්‍රය | N - සන්දර්භය | O - පෙරහනු |

(22) ඉහත අංග අතුරෙන් හැරල්ඩ් ඩී ලැස්වෙල් ආකෘතියට අයත් **නොවන** අංග තුනක් වන්නේ,

(1) A B C (2) A B H (3) B H E
(4) A B E (5) F G J

(23) ඉහත දක්වා ඇති අංග අතුරෙන් A හා E අතර අවබෝධයක් ඇති කිරීමට D අපොහොසත් වන්නේ නම් එය හඳුන්වන්නේ,

(1) H ලෙස ය. (2) L ලෙස ය. (3) G ලෙස ය.
(4) O ලෙස ය. (5) K ලෙස ය.

(24) ඉහත අංග අතුරෙන් ශ්‍රාම් ඔස්ගුඩ් ආකෘතියට අයත් අංග වන්නේ,

(1) A B C D (2) A B E J (3) A D E F
(4) A B H E (5) A B J I

(25) ෂැනොන් වීවර් ආකෘතිය තුළ ඇති වැදගත් අංග දෙකක් වන්නේ,

(1) A B වේ. (2) B C වේ. (3) D E වේ.
(4) A I වේ. (5) G I වේ.

(26) ඉහත දක්වන ලද අංග අතුරෙන් සන්නිවේදන ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සන්නිවේදකයාට මෙන් ම ග්‍රාහකයාට ද වැදගත් වන්නේ,

(1) J හි හැකියාවයි. (2) L හි හැකියාවයි. (3) G හි හැකියාවයි.
(4) I හි හැකියාවයි. (5) M හැකියාවයි.

(27) HUB ආකෘතියේ පමණක් දැකිය හැකි අංග දෙකක් වන්නේ,

(1) D, E වේ. (2) A,C වේ. (3) M,N වේ.
(4) K, L වේ. (5) B,H වේ.

(28) ලෝකයේ සමහර රටවල ජනමාධ්‍ය නාලිකාවන් මෙන්ම මාධ්‍ය ආයතන සඳහා බලපෑම් කරන දැන්වීම් ආයතන මෙන්ම බහුජාතික සමාගම් හැඳින්විය හැක්කේ,

(1) O ලෙස ය. (2) K ලෙස ය. (3) L ලෙස ය.
(4) I ලෙස ය. (5) A ලෙස ය.

(29) අතථ්‍ය සන්නිවේදනය විශේෂතා රැසකින් සමන්විත ය. ඊට අදාළ **නොවිය** හැකි වන්නේ,

(1) කාර්යක්ෂම ව සන්නිවේදනයේ යෙදීමේ හැකියාව යි.
(2) ශ්‍රව්‍ය දෘශ්‍ය අංග සහිතව සන්නිවේදනයේ යෙදීමේ හැකියාව යි.
(3) එකවර පුද්ගලයන් රැසක් සමඟ සන්නිවේදනයේ යෙදීමේ හැකියාව යි.
(4) අධික පිරිවැයක් හා අනාරක්ෂිතව සන්නිවේදනයේ යෙදීමේ හැකියාව යි.
(5) භෞතික වශයෙන් ඉඩකඩක් අවශ්‍ය නොවීම යි.

(30) ලිඛිත හෝ කථන භාවිතයෙන් තොරව සිදුකරන සන්නිවේදනය නිර්වාචික සන්නිවේදනය යි. එහි ශරීර භාෂාවට අයත් නොවන අංගයක් වන්නේ,

(1) ඉරියව් (2) ඉඟි (3) සංඛ්‍යා
(4) ආංගික අභින (5) පාර භාෂාව

(31) දෘශ්‍ය සන්නිවේදන කුසලතා වර්ධනයට හේතු නොවන අංගයක් විය හැක්කේ,

(1) රූප මැනවින් දැකීම. (2) රූප හඳුනාගැනීම.
(3) රූප භාවිතයට ගැනීම. (4) රූප නිර්මාණය කිරීම.
(5) මැනවින් සවන් දීම.

(32) බාහිර උපකරණ **අවශ්‍ය නොවන** සන්නිවේදන වර්ගය වන්නේ,

(1) අන්තර්වර්තී සන්නිවේදන ය. (2) නිර්වාචික සන්නිවේදනය ය.
(3) රූපණ සන්නිවේදනය ය. (4) අවිධිමත් සන්නිවේදනය ය.
(5) පුද්ගලාන්තර සන්නිවේදනය ය.

(33) සන්නිවේදන ක්‍රියාවලියේ බාධා ඇතිවීම ස්වභාවික ය. අර්ථ බාධාවක් ඇති වීමට වඩාත් තුඩු දිය හැකි වන්නේ,

(1) පණිවිඩ සම්ප්‍රේෂණය (2) තාක්ෂණික විෂමතා
(3) ග්‍රාහක දුර්වලතා (4) සංකේත තෝරා ගැනීම.
(5) අත්දැකීම් පසුතලය

(34) ගුවන්විදුලි මාධ්‍ය භාවිතයේ දී පහත ලක්ෂණ පිළිබඳ ව අවධානය යොමු කළ යුතු බව රවිඳු ප්‍රකාශ කළේ ය.

A - ශ්‍රව්‍ය මාධ්‍යයක් වීම. B - විදග්ධ භාෂා රටාවක් තිබීම.
C - පරිකල්පනීය භාෂාවක් තිබීම. D - සරල භාෂාවක් තිබීම.

මෙයින් **සත්‍ය** වන්නේ,

(1) A B C ය. (2) A C D ය. (3) A B ය.
(4) B C D ය. (5) A B D ය.

(35) ප්‍රාදේශීය ප්‍රවෘත්ති සංස්කාරක වෙත ලැබුණු ප්‍රවෘත්ති වාර්තාවල ඇතුළත් වූ වැකි කිහිපයක් පහත දැක්වෙයි. එහි සඳහන් **නිරවද්‍ය** වාක්‍ය තෝරන්න.

(1) ඔවුහු ජනාධිපතිතුමා මුණ ගැසේවි. (2) ශ්‍රී ලාංකිකයෝ සිංහලයෝ වෙති.

(3) කෙනෙකු නිශ්ශබ්දව සිටියහ. (4) මා ඔවුන් හඳුනමි.

(5) ගං වතුර ගලති යි මන්ත්‍රීන් කියති.

(36) සමාජ මාධ්‍ය ප්‍රභේදවලට අයත් මාධ්‍ය අතර අවම වැදගත්කමක් ඇති ප්‍රභේදය ලෙස සැලකෙන්නේ,

(1) ෆේස් බුක් (2) ට්විටර් (3) ලින්ක්ඩ්ඉන්

(4) විකිපීඩියා (5) යූ ටියුබ්

(37) සමාජ මාධ්‍යයන්හි දැකිය හැකි කර්යාභාරයක් **නොවන්නේ,**

(1) පුද්ගලයන් ප්‍රචණ්ඩ ක්‍රියාවලට යොමු කිරීම.

(2) අන්තර්ජාලය ඔස්සේ විවිධ තොරතුරු බෙදා හදා ගත හැකි වීම.

(3) තොරතුරු සාකච්ඡා කිරීමට හා වෙනස් කිරීමට හැකි වීම.

(4) දැනුම ගබඩා කිරීමේ පහසුව හා හුවමාරු කළ හැකි වීම.

(5) පවතින සමාජ මත වෙනස් කළ හැකි වීම.

(38) ජනමාධ්‍යයේ කාර්යභාරය අතර අවම වැදගත්කමක් ලෙස සැලකිය හැක්කේ,

(1) ග්‍රාහක රසඥතාවය පුළුල් කිරීමට සහාය වීම.

(2) නවෝත්පාදන විසරණය සඳහා තොරතුරු කේන්ද්‍රස්ථානයක් කිරීම.

(3) ඥාන වර්ධනය සඳහා උපකාර කිරීම.

(4) ප්‍රේක්ෂක මත හා අදහස් හැඩ ගැස්වීම.

(5) සමකාලීන සමාජ විඥානය ජනප්‍රිය සංස්කෘතියට අනුගත කිරීම.

(39) සාම්ප්‍රදායික මාධ්‍යයේ ඇති වැදගත්කම පිළිබඳව ප්‍රකාශ කීපයක් පහත දැක්වේ.

A - දැනුම් ඉගෙනුම් සම්පාදනය

B - උපදේශාත්මක සන්දේශ ජනනය කිරීම.

C - මතවාදී කාර්යයක් ඉටු කිරීම.

D - සංස්කෘතික අංග හුවමාරු කිරීම.

E - අහිතකර සමාජ ප්‍රවණතා විවේචනයට ලක් කිරීම.

ඉහත ප්‍රකාශ අතර **සත්‍ය** වන්නේ,

(1) A B C D (2) B C D E (3) A B D E

(4) B C D E (5) AB CD හා E යන සියල්ල

(40) මාර්ගගත දත්ත පද්ධතියක සම්බන්ධය මඟින් විවිධ තොරතුරු මූලයන්ට ළඟාවීමට හැකියාව ඇත්තේ,

(1) අංකිතකරණය මඟිනි (2) ජාලගතකරණය මඟිනි

(3) අන්තර් ක්‍රියාකාරිත්වය මඟිනි (4) අධි පාඨනීයත්වය මඟිනි

(5) ස්වයංකරණය මඟිනි

(41) පළමු වරට හමුවන පුද්ගලයන් දෙදෙනකු අතර සාමාන්‍යයෙන් සිදුවන සන්නිවේදනයේ දී දැකගත හැකි අවස්ථා කීපයක් පහත දැක්වේ.

A - පොදු විස්තර කතා කිරීම.

B - විවෘත හා ගැඹුරු විශ්වාසනීයත්වයකින් යුත් අදහස් හුවමාරුව

C - එකිනෙක සිනහ වීම හා හිස වැනීම.

D - පෞද්ගලික තොරතුරු හුවමාරු කර ගැනීම.

එම සන්නිවේදන ක්‍රියාවලියෙහි අවස්ථා ආරම්භයේ සිට අනුපිළිවෙළින් දැක්වෙන්නේ,

(1) A C D හා B වේ. (2) C A D හා B වේ. (3) D B A හා C වේ.

(4) C D B හා A වේ. (5) B C D හා A වේ.

(42) නව මාධ්‍ය අපගේ ගෘහ ජීවිතය ආක්‍රමණය කර ඇති බව එක්තරා දේශකයෙක් අවධාරණය කර සිටියේ ය. එමගින් ඔහු අදහස් කරන්නේ,

(1) නව මාධ්‍ය භාවිතයේ පිරිවැය අවම වී ඇති බවයි.

(2) නව මාධ්‍යයේ ප්‍රබලත්වය ශීඝ්‍රයෙන් ඉහළ යන බවයි.

(3) නව මාධ්‍ය භාවිතය ප්‍රචණ්ඩත්වය වර්ධනය වීමට හේතු වී ඇති බවයි.

(4) නව මාධ්‍ය තාක්‍ෂණයේ ප්‍රබලත්වය ශීඝ්‍රයෙන් ඉහළ යන බවයි.

(5) නව මාධ්‍ය භාවිතය ඉහළ යාම මඟින් පුද්ගලයා හුදෙකලා වී ඇති බවයි.

(43) ජනමාධ්‍ය ලෙස අර්ථකථනය කරන්නේ පුළුල් ප්‍රදේශයක විසිරී පවතින බහුවිධ අදෘශ්‍ය ග්‍රාහක කොට්ඨාෂයකට මෙම නිර්වචනය ඉදිරිපත් කර ඇත්තේ ආමන්ත්‍රණය කරන මාධ්‍ය වේ.

(1) විල්බර් ශ්‍රාම් විසිනි. (2) චාල්ස් එච් කූලි විසිනි.

(3) යුනෙස්කෝ ආයතනය විසිනි. (4) ගෘන්වර්ල්ට් කොමිසම මඟිනි.

(5) ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂය මඟිනි.

(44) ජනකවිවල දැකිය හැකි සුවිශේෂී ලක්‍ෂණය වන්නේ,

(1) ප්‍රාදේශීය බස් වහරක් භාවිතයට ගැනීම.

(2) ලිඛිත මූලාශ්‍රවල ද දැකිය හැකි වීම.

(3) විවිධ පුද්ගලයන්ගේ අත්දැකීම්වලට සහාය වීම.

(4) දීර්ඝ කාලයක් මුළුල්ලේ මිනිසුන් අතර ජනශ්‍රැතියක් ලෙස පැවතීම.

(5) නිර්මාණකරුවා හඳුනාගත හැකි වීම.

(45) ශාන්තිකර්ම හා යාතු කර්ම නිර්මාණාත්මක සන්නිවේදනයට අයත් වේ. ඊට අදාළ **නොවන** අංගය වන්නේ,

(1) කොහොඹාකංකාරිය (2) වලියක් මංගල්‍යයය

(3) රූකඩ හා කෝලම් (4) කඩවර කංකාරිය

(5) බලි ශාන්තිකර්මය

(46) රූපවාහිනී මාධ්‍යයේ මූලික ලක්‍ෂණ අතරට අයත් නොවන්නේ,

(1) විවිධාකාර අන්තර්ගතයන්ගෙන් හා විචිත්‍රවත් ආකෘතිවලින් යුක්ත වීම.

(2) කලාත්මක වෘත්තාන්ත බහුල වීම.

(3) පුද්ගලයාගේ පූර්ණ අවධානය නදිනාගන්නා මාධ්‍යයක් වීම.

(4) විධිමත් ආයතනගත සංවිධාන ව්‍යුහයකින් යුක්ත වීම.

(5) ජාතික හා ජාත්‍යන්තර ලක්‍ෂණවලින් යුක්ත වීම.

(47) ජනමාධ්‍ය අනෙකුත් සන්නිවේදන වර්ගවලින් වෙනස් වීමට බලපාන ප්‍රධාන සාධකය වන්නේ,

(1) සංකීර්ණ තාක්‍ෂණික මෙවලම් භාවිත කිරීම.

(2) ක්‍ෂණික ප්‍රතිපෝෂණයක් පැවතීම.

(3) ශ්‍රව්‍ය දෘශ්‍ය අංග සහිතව සන්නිවේදනයේ යෙදීම.

(4) දැනුම සම්පත් ආදිය බෙදා හදා ගත හැකි වීම.

(5) පහසුවෙන් අන්‍යෝන්‍ය අවබෝධය හා විශ්වාසය තහවුරු කරගත හැකි වීම.

(48) **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) සමූහ සන්නිවේදනය ඒකමාර්ගික හෝ ද්විමාර්ගික වේ.

(2) නයකත්ව සාධනය වඩා වැදගත් වන්නේ සමූහ සන්නිවේදනයේ දී ය.

(3) පුද්ගලාන්තර සන්නිවේදනයේ දී ප්‍රතිපෝෂණය ක්‍ෂණික වේ.

(4) සමූහය කුඩා හෝ විශාල විය හැකි ය.

(5) සමූහ සන්නිවේදනයක් සිදුවන්නේ ද යන්න හුදු ග්‍රාහක සංඛ්‍යාව මත පමණක් තීරණය වන්නකි.

(49) ඵලදායී සන්නිවේදනයක් සඳහා අවම වැදගත්කමක් දක්වන්නේ,

(1) සමාන අත්දැකීම් පසුතලයක් පැවතීම.

(2) සන්දර්භය අනුව පණිවිඩ විශ්ලේෂණය කිරීම.

(3) සන්නිවේදන තාක්‍ෂණය පිළිබඳ අවබෝධයක් පැවතීම.

(4) ග්‍රාහක ක්‍ෂෙත්‍රය පිළිබඳ අවබෝධයක් පැවතීම.

(5) සංස්කෘතිය ගැන අවධානය යොමු කිරීම.

(50) ජනමාධ්‍ය මඟින් සිදු කරන වැදගත් මෙහෙවරක් වන්නේ ජනයා පොදු ජීවන රටාවකට අවශ්‍ය හර පද්ධතිය පිළිබඳ දැනුම්වත් කිරීම යි. එය වඩාත් හොඳින් දැකගත හැකි වන්නේ, ජනමාධ්‍යයේ,

(1) සමාජානුයෝජනය මඟින් (2) ප්‍රචාරණය මඟිනි.

(3) සංජානනය මඟිනි. (4) දැන්වීම් මඟිනි.

(5) ප්‍රවෘත්ති මඟිනි.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Southern Provincial Department of Education

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 12 ශ්‍රේණිය, මධ්‍ය වාර පරීක්ෂණය, 2020 මාර්තු

**General Certificate of Education (Adv. Level), Grade 12, Mid Term Test, March 2020**

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය- II**
**Communication and Media Studies - II**

29 S II

පැය 03යි
**Three hours**

විභාග අංකය : ....................................................................

***සැලකිය යුතුයි.***

- **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

(01) සන්නිවේදනය යනු මානවයාගේ පැවැත්මට අත්‍යවශ්‍ය සාධකයකි.

(i) සන්නිවේදනය පිළිබඳ විල්බර් ශ්‍රාම්ගේ නිර්වචනය ලියන්න.

(ii) සන්නිවේදනයේ ස්වභාවයන් හතරක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) සන්නිවේදන අරමුණු තුනක් උදාහරණ මඟින් පැහැදිලි කරන්න.

(iv) සන්නිවේදනය ශාස්ත්‍රීය විෂයන් ලෙස අධ්‍යයනය කිරීමේ වැදගත්කම් හතරක් විමර්ශනය කරන්න.

(02) ස්වාභාවික විපත්වල දී මාධ්‍ය සතු කාර්ය අති විශාල ය.

(i) ජනමාධ්‍යය සතු ලක්ෂණ හතරක් නම් කරන්න.

(ii) සමාජ මාධ්‍ය හතරක් නම් කර ස්වාභාවික විපත්වල දී ඒවා යොදා ගත හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) ජනමාධ්‍යයට අදාළව නිර්මාණය කර ඇති ෂැනොන් වීවර් ආකෘතිය පැහැදිලි කරන්න.

(iv) ස්වාභාවික විපත්වල දී ජනමාධ්‍යයේ කාර්යභාරය පිළිබඳ ව රචනයක් ලියන්න.

(03) සන්නිවේදනය ශාස්ත්‍රීය විෂයක් ලෙස අධ්‍යයනය කිරීම ප්‍රවණතාවක් වී ඇත.

(i) සන්නිවේදන අධ්‍යයනය සඳහා තුඩුදුන් සාධක හතරක් නම් කරන්න.

(ii) යුනෙස්කෝ සංවිධානය සන්නිවේදනය පාසල් විෂය මාලාවට ඇතුළත් කිරීමට යෝජනා කළ කරුණු දෙකක් දක්වන්න.

(iii) සන්නිවේදනය යනු සබඳතා පැවැත්වීමේ ක්‍රියාවලියයි. මෙය කරුණු තුනක් ඔස්සේ උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(iv) සන්නිවේදන මූලිකාංග හතරක් ජනමාධ්‍ය තුළ ක්‍රියාත්මක වන ආකාරය විස්තර කරන්න.

(04) සන්නිවේදනය තුළ අවස්ථානුකූල බවක් හා රටාවක් පවතී.

(i) සන්නිවේදන ස්වරූප හතරක් නම් කරන්න.

(ii) අතථ්‍ය සන්නිවේදනයේ විශේෂතා හතරක් නම් කර ඉන් දෙකක් පැහැදිලි කරන්න.

(iii) මහජන සන්නිවේදනයේ ප්‍රයෝජන තුනක් පැහැදිලි කරන්න.

(iv) නිර්වාචික සන්නිවේදනය විශ්ව සන්නිවේදනයට මඟ පාදයි. එහි මූලික ලක්‍ෂණ හතරක් ඇසුරෙන් විස්තර කරන්න

(05) කාලාන්තරයක් තිස්සේ ගැමි ජනතාව තුළ තිබූ දැනුම තොරතුරු ආදිය සම්ප්‍රදායික සන්නිවේදනයෙන් නිරූපණය වේ.

(i) සාම්ප්‍රදායික සන්නිවේදනයේ සුවිශේෂතා හතරක් නම් කරන්න.

(ii) සම්ප්‍රදායික සන්නිවේදන විධි හතරක් නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න.

(iii) සම්ප්‍රදායික සන්නිවේදනයේ වැදගත්කම් තුනක් උදාහරණ සහිතව විස්තර කරන්න.

(iv) ගැමිනාටක මගින් නිර්මාණාත්මක සන්නිවේදනයෙන් සිදු කරයි. මේ පිළිබඳ රචනයක් ලියන්න.

(06) ජන සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා කාලය හෝ දුර අතර සන්දේශ හුවමාරු කර ගැනීමට යොදනු ලබන උපක්‍රමය ජනමාධ්‍ය යයි.

(i) ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය ජනමාධය නිර්වචනය කර ඇත්තේ කෙසේද?

(ii) ජනමාධ්‍යයේ සුවිශේෂ කාර්ය භාරයක් යුනෙස්කෝව හඳුන්වා දී ඇත. ඉන් දෙකක් පැහැදිලි කරන්න.

(iii) ගුවන්විදුලි මාධ්‍යයේ මූලික ලක්‍ෂණ තුනක් උදාහරණ මඟින් විස්තර කරන්න.

(iv) සිනමාව රූපවාහිනී මාධ්‍යයෙන් වෙනස්වන ආකාරය සංසන්දනාත්මකව විස්තර කරන්න.

(07) නව මාධ්‍ය යනු අංකිත තාක්‍ෂණය ඔස්සේ ඉතා වේගයෙන් තොරතුරු බෙදා හැරිය හැකි මාධ්‍යයකි.

(i) ලෝක ව්‍යාප්ත ජාලය (www.) පිළිබඳ අදහස ඉදිරිපත් කළේ කවුරුන්ද?

(ii) නව මාධ්‍යවල දක්නට ලැබෙන ලක්‍ෂණ හතරක් නම්කර ඉන් එකක් පැහැදිලි කරන්න.

(iii) සමාජ මාධ්‍ය තුනක් නම් කර ඒවා වෙන් වෙන් ව පැහැදිලි කරන්න.

(iv) සමාජ මාධ්‍යයේ යහපත් හා අයහපත් බලපෑම් පිළිබඳ රචනයක් ලියන්න.

**Answer**

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
**Southern Provincial Department of Education**

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 1 2 ශ්‍රේණිය, විභාග මධ්‍ය වාර පරීක්ෂණය, 2020 මාර්තු

**General Certificate of Education (Adv. Level), Grade 12, Mid Term Test, March 2020**

# සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය - පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| 01. (3) | 11. (3) | 21. (5) | 31. (5) | 41. (2) |
| 02. (1) | 12. (2) | 22. (4) | 32. (1) | 42. (1) |
| 03. (2) | 13. (4) | 23. (3) | 33. (4) | 43. (5) |
| 04. (5) | 14. (3) | 24. (2) | 34. (2) | 44. (4) |
| 05. (3) | 15. (5) | 25. (5) | 35. (2) | 45. (3) |
| 06. (5) | 16. (1) | 26. (1) | 36. (4) | 46. (2) |
| 07. (2) | 17. (2) | 27. (4) | 37. (1) | 47. (1) |
| 08. (4) | 18. (5) | 28. (2) | 38. (5) | 48. (5) |
| 09. (1) | 19. (3) | 29. (4) | 39. (3) | 49. (3) |
| 10. (4) | 20. (1) | 30. (3) | 40. (4) | 50. (1) |

(ලකුණු 1 × 40 = 40)

## II පත්‍රය

(01) (i) තොරතුරු ගැබ් වූ සංඥාවක් කරණ කොටගෙන දෙපාර්ශවයක් අතර එක හා සමාන චිත්ත ස්වභාවයක් ඇති වීම සන්නිවේදනයයි.

(ලකුණු 02)

(ii)
- අරමුණු සහගත වීම.
- සංකේතාත්මක වීම.
- සන්දර්භයානුගත වීම.
- ක්‍රියාපටිපාටියක් වීම.
- විවිධාකාර වීම. (1 x 4 = 4)

(iii)
- තොරතුරු සම්පාදනය
- උපදෙස් සම්පාදනය
- පෙළඹවීම
- විනෝදාස්වාද සම්පාදනය (2 x 3 = 6)

(iv)
- ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සන්නිවේදන ක්‍රියාදාමය හා මාධ්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ අවබෝධය, විචාරශීලීව මාධ්‍ය පරිහරණය කිරීමේ කුසලතා වර්ධනය
- අවශ්‍ය අදාළ තොරතුරු තෝරාගැනීමේ හැකියාව
- ගවේෂණශීලී භාවය.
- විචාරශීලි චින්තනය දියුණුවීම මාධ්‍ය සංරක්ෂතාව ආදිය

(2 x 4 = 8)

(02) (1)
- තාක්ෂණික මෙවලම් භාවිතය
- ක්ෂණික හා අඛණ්ඩ වීම.
- සංවිධානගත ආයතන ව්‍යුහයක් පැවතීම.
- වෘත්තීය සන්නිවේදකයන් සිටීම.
- බහුවිධ දොරටුපාලකයන් සිටීම.
- බහුවිධ ග්‍රාහකත්වයක් තිබීම.


(1/2 x 4 = 2)

(ii)
- ෆේස් බුක්
- ලින්ක්ඩ්ඉන්
- ඉන්ස්ටර් ග්‍රෑම්
- ට්විටර්
- පින්ට රෙස්ට්
- ස්කයිප්
- වයිබර්

1. පූර්ව දැනුම්වත් කිරීම.
2. සහනාධාර එකතු කිරීම.
3. කණ්ඩායම් සංවිධානය කිරීම.
4. සහන කණ්ඩායම් දිරිමත් කිරීම.
5. වංචා දූෂණ ආදිය හෙළි කිරීම (ආධාර බෙදාදීම)
6. ප්‍රධාන මාධ්‍යට ඇස නොගැටුන තැන් පෙන්වාදීම

(2 + 2 = 4)

(iii)




(iv)
- පූර්ව දැනුම්වත් කිරීම.
- තොරතුරු ඉදිරිපත් කිරීම./ සහන සේවා
- ආපදා කළමනාකරණය කිරීම.
- ආධාර බෙදීම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.
- පශ්චාත් අවධියේදී මිනිසුන් ගේ මානසික තත්ත්ව සමනය කිරීම.
- කුඩා දරුවන් සඳහා වැඩසටහන් සම්පාදනය

(03) (1) ☛ කාර්මීකරණය හා සන්නිවේදන මාධ්‍යයේ වර්ධනය
☛ පළමුවන හා දෙවන ලෝක සංග්‍රාම හා මාධ්‍යයේ ක්‍රියාකාරිත්වය ජනමාධ්‍ය බිහිවීම හා එහි බලපෑම
☛ අන්තර්ජාලය ඇතුළු අංකිත සන්නිවේදන තාක්‍ෂණ, මාධ්‍ය මෙවලම්හි දියුණුව
(1/2 x 4 = 2)

(ii) ☛ මාධ්‍ය සංරක්‍ෂතාව ඇති කිරීම.
☛ ජන මාධ්‍යවල අහිතකර ක්‍රියාකාරිත්වය ප්‍රබල වීම. (2 x 2 = 4)

(iii) ☛ ඥාති සබඳතා ☛ පුද්ගල සබඳතා
☛ මිත්‍ර සබඳතා ☛ රාජ්‍ය සබඳතා
☛ අන්තර්ජාතික සබඳතා
☛ අන්තර් සංස්කෘතික සබඳතා (2 x 3 = 6)

(iv) ☛ සන්නිවේදන ☛ ආකේතකරණය
☛ සංදේශය ☛ මාධ්‍ය
☛ ග්‍රාහකයා ☛ විකේත කරණය
☛ බලපෑම ආදිය (2 x 4 = 8)

(04) (i) ☛ වාචික සන්නිවේදනය
☛ නිර්වාචික සන්නිවේදනය
☛ ලිඛිත සන්නිවේදනය
☛ ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදනය
☛ රූපණ සන්නිවේදනය (1/2 x 4 = 2)

(ii) ☛ කාර්යක්‍ෂම ව සන්නිවේදනයේ යෙදීමේ හැකියාව
☛ අඩු පිරිවැය ආරක්‍ෂිත බව
☛ ශ්‍රව්‍ය දෘශ්‍ය අංග සහිතව සන්නිවේදනයේ යෙදීම. (2 x 2 = 4)

(iii) ☛ කිසියම් අරමුණක් සඳහා ජන සමූහයක් පොළඹවා ගැනීමට හැකි වීම.
☛ ප්‍රස්තුත කරුණු පිළිබඳ ව වැඩිදුර දැනුවත් කිරීමක් සිදු කිරීම.
☛ ප්‍රතිරූප ගොඩ නංවා ගැනීමට උපකාරී වීම.
☛ කිසියම් මතයක් නිර්මාණය කිරීමට හේතු වීම.
☛ විවිධ පාර්ශවවල අවධානය දිනා ගැනීමට හැකිවීම. (2 x 3 = 6)

(iv) ලිඛිත හෝ කථන වචන භාවිතයෙන් තොරව පුද්ගලයෙකු විසින් තවත් පුද්ගලයෙකු වෙත තොරතුරු ඉදිරිපත් කිරීමයි.
☛ ශරීර බස (Body Language)
☛ සංඥා (Signal)
☛ සංකේත (Symbol)
☛ ඉරියව්, ඉඟි, මුද්‍රා, අභින, රූප, සලකුණු, ලාංඡන
(2 x 4 = 8)

(05) (i) ☛ සරල ව්‍යුහය- ☛ තේමා අන්තර්ගතය
☛ නම්‍යශීලිත්වය - ☛ සංස්කෘතික සන්දර්භය
☛ අවම පිරිවැය (1/2 x 4 = 2)

(ii) ☛ ජනකවි ☛ ගැමිනාටක
☛ ජනකතා ☛ ශාන්තිකර්ම හා යාතුකර්ම
(2 x 2 = 4)

(iii) ☛ දැනුම් ඉගෙනුම් සම්පාදනය
☛ උපදේශාත්මක සන්දේශ ජනනය කළ හැකි වීම.
☛ සංස්කෘතික අංග හුවමාරු කිරීමට හැකි වීම.
☛ භාව ප්‍රකාශනය
☛ අහිතකර සමාජ ප්‍රවණතා විවේචනය
☛ විනෝදය සම්පාදනය කිරීම. (2 x 3 = 6)

(iv) ☛ ගැමි නාටක ආශ්‍රයෙන් මහා සන්නිවේදනයක් කිරීම.
☛ එහි ආකර්ශණීයභාවය
☛ ඉදිරිපත් කිරීමේ නිර්මාණාත්මක බව ආදිය ඇසුරුකොට විස්තර කරන්න.
(2 x 4 = 8)

(06) (i) අදෘශ්‍ය මානව වෙසෙන පිරිසකට කිසියම් මාධ්‍යයකින් අමතන්නේ නම් එය ජනමාධ්‍ය වේ.
(ලකුණු 02)

(ii) ☛ සුපරීක්‍ෂණය - ☛ අර්ථ කථනය
☛ සමසම්බන්ධය - ☛ සමාජානුයෝජනය
(1 x 4 = 4)

(iii) ☛ ක්‍ෂණික වීම
☛ පුළුල් කලාපයක් ආවාණය කරයි.
☛ එක් දිශාවකට සංදේශ ගමන් කරයි.
☛ සරල ජංගම මාධ්‍යයකි.
☛ පරිකල්පනීය මාධ්‍යයකි.
(2 x 3 = 6)

(iv) **රූපවාහිනිය** **සිනමාව**
☛ විකාශනය ☛ ප්‍රේක්ෂපණය
☛ ගෘහස්ථ ☛ සිනමාශාලාව තුළ
☛ එළිමහනේ සිට ☛ අඳුරේ සිට
☛ මුදල් ගෙවීමක් නැත ☛ මුදල් ගෙවිය යුතුයි
☛ කලාත්මක නොවේ ☛ කලාත්මක වේ
☛ විවිධ සංදේශ ☛ වෘතාන්ත
(2 x 4 = 8)

(07) (i) ටිම් බර්නස් ලී (ලකුණු 02)

(ii) ☛ අංකිතකරණය ☛ ජාලගතකරණය
☛ අන්තර් ක්‍රියාකාරිත්වය
☛ අධිපාඨනීයත්වය ☛ ස්වයංකරණය
☛ දත්ත සංචිතය
☛ වේගවත් සන්දේශකරණය
(1 x 4 = 4)

(iii) ☛ ෆේස්බුක් ☛ ඉන්ස්ටර්ග්‍රෑම්
☛ ට්විටර් ☛ ස්කයිප්
☛ ලින්ක්ඩින් ☛ වයිබර්
☛ පින්ටරෙස්ට් (2 x 3 = 6)

(iv) **යහපත් බලපෑම**
☛ සයිබර් හිරිහැර හා උවදුරු
☛ ප්‍රචණ්ඩ ක්‍රියාවලට පෙළඹවීම.
☛ වැරැදි තොරතුරු පළ කිරීම.
☛ ව්‍යාජ ගිණුම් සැකසීම. (2 x 4 = 8)


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
G.C.E. O/L
(අ.පො.ස. සා.පෙළ)
විද්‍යාව
A9+
GUIDE
PAST PAPERS
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
G.C.E. O/L
(අ.පො.ස. සා.පෙළ)
සිංහල
A9+
G.C.E. O/L SINHALA
General English
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440